# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2397/29 - 2024 අගෝස්තු මස 14 වැනි බදාදා - 2024.08.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත**

1996 අංක 27 සහ 2024 අංක 39 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත් මගින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22 වගන්තිය සමග කියවිය යුතු 71 (1) වගන්තිය යටතේ තාක්ෂණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
ජනාධිපති,
තාක්ෂණ අමාත්‍ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි චන්ද්‍රිකා විකාශන සේවා රෙගුලාසි යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2024 අගෝස්තු මස 13 වැනි අඟහරුවාදා දින සිට බලපැවැත්වේ.

2. පරිශීලක පර්යන්ත ඇතුළුව චන්ද්‍රිකා විකාශන සේවා මගින් ගුවන් විදුලි සංඛ්‍යාත හෝ ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණ භාවිත කිරීම සඳහා බලපත්‍ර ගාස්තු මෙහි උපලේඛනයේ දක්වා ඇත.

3. මෙම රෙගුලාසිවල, පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස - "බලපත්‍රය" යන්නෙන් පනතේ 22 වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් අදහස් වේ.

**උපලේඛනය**

| *විස්තරය* | *වාර්ෂික ගාස්තුව (රු.)* |
| --- | --- |
| පරිශීලක පර්යන්ත ඇතුළුව චන්ද්‍රිකා විකාශන සේවා | 250, 000 (එක් විදුලි සංදේශ ක්‍රමයකට) |

EOG - 08 - 0179

1A - PG 6824 — 05 (2025/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ*